# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 59 — 1973 මැයි 11 වැනි සිකුරාදා — 1973.05.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස : (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 559 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 566 |


## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි. දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් ඇවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළු නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

(ආ) වර්ෂ 1973. 06. 18 දින වන විට වයස අවුරුදු 21 ට නොඅඩු බවට සහ 35 ට නොවැඩි බවට (දැනටමත් රජයේ සේවයෙහි නියුක්තවූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව පිළිබඳව I වැනි හෝ II වැනි පංතියෙහි ගෞරව උපාධියක් තිබීම බවට.

5. අවශ්‍යයැයි දන්වනු ලැබූ විට පහත සඳහන් කරන ලියවිලි සියල්ල හෝ ඉන් කවර ලියවිල්ලක් හෝ අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කළ යුතු වේ.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—මේ සඳහා බව්තීස්ම සහතිකය හෝ උපක්‍රෘත පාඨශාලා සම්බන්ධ නීති මාලාව අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ තමන් ලබා සිටින උසස්ම අධ්‍යාපනික සහතික.

(ඇ) චරිත සහතික පත්‍ර දෙකක්—මෙයින් එකක් ස්වකීය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂක, විද්‍යාලයීය ආචාර්ය හෝ මහාචාර්යවරයාගෙන් ලත් සහතිකයක් විය යුතුය.

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල-දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමර්ථ වූ උසස්ම පරීක්ෂණය පිළිබඳ සහතික.

සැලකිය යුතු.—(i) අයදුම් පත්‍රය සමග කිසිම ලියවිල්ලක් හෝ ලියවිලි පිටපතක් හෝ අමුණා නොඑවිය යුතුය.

(ii) අවශ්‍ය වූ විට ලියවිලි ඉදිරිපත් කිරීමට අසමර්ථ වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේවුවද වූවත්, තම ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ට ලැබෙන සේ තම ඉල්ලුම් පත්‍ර එව්වේ කවදා දැයි ඔහුට කෙලින්ම දන්වා එවිය යුතුය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් නැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඇම්. චන්ද්‍රසේන,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්.

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී ය.
තැපැල් පෙට්ටිය 512,
කොළඹ 1, 1973.

**රසායන හා ශාකාණු විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———.

2. ස්ථිර ලිපිනය :———.

3. (අ) උපන් දිනය :———.

(ආ) 1973-06-18 දිනට වයස :—

අවු :———. මාස :———. දින :———.

4. ජාතිය :———.

(අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද, යන වග :———.

(ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම්, පහත දැක්වෙන අය උපන් ස්ථානය සඳහන් කරන්න :—

(i) අයදුම්කරු :———.
(ii) අයදුම්කරුගේ පියා :———.
(iii) අයදුම්කරුගේ පියාගේ පියා :———.
(iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.

5. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :———.

(ආ) විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන වග :———.

6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :———.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :———.

(i) සිංහල
(ii) දෙමල
(iii) ඉංග්‍රීසි

8. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද?
ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණද?

9. ඔබ සාපරාදී වරදකට උසාවියේ දී චෝදනා ලැබුවෙක් ද, එසේ නම්, දිනයන් හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න :
———.

10. දැනට කරන රැකියාව හා ඊට ප්‍රථම කරන ලද රැකියාවන් :—
(විස්තර සඳහන් කරන්න)

11. වෙනත් තොරතුරු කිසිවක් වෙත් නම් :———.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

5-201—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**සමාජ සේවා අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර

**සංශෝධිත දැන්වීම**

මෙම තනතුර සඳහා ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 1972 දෙසැම්බර් මස 8 වැනි දින පළ කල දැන්වීමට අමතරව මෙම සංශෝධිත දැන්වීම පලකරණු ලැබේ. එකී දැන්වීමේ 5 වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් යන කොටස් පහත සඳහන් පරිදි දැන් සංශෝධනය කොට ඇත.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ සනීපයකින් යුතු බව.

(ආ) ලංකා පුස්ථකාල සංගමයේ ප්‍රථම විභාගය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්ථකාලයාධිපති විද්‍යාල පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ඊට සමාන විභාගයකින් සමත් වී ඇති බව.

(ඇ) පිළිගත් පුස්ථකාලයක පුස්ථකාලයාධිපති වශයෙන් හෝ සහකාර පුස්ථකාලයාධිපති කෙනෙකු වශයෙන් හෝ අඩුම වශයෙන් මාස 6 ක පළපුරුද්දක් ඇති බව.

මෙම සංශෝධන දැන්වීම පරිදි අයදුම් කරන අය, 1972.12.8 වැනි දින පළ කල ගැසට් දැන්වීමේ සඳහන් ආකෘති පත්‍රය පරිදි පිළියෙළ කළ අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් 1973 මැයි 21 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

මුලදී අයදුම්පත් එවූ අය, නැවතත් අයදුම්පත් එවීම අනවශ්‍යය.

ප. ධ. උඩුවෙල,
සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්.

සමාජ සේවා අමාත්‍යාංශය,
14, බාන්ස් පෙදෙස;
කොළඹ 7.
1973 මැයි මස 2 වැනි දින දී ය.

5-206—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්වන වැලිපැන්න ගම් සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, ඉදිගස්තුඩුව, වලගෙදර, මීගම, ආදුවල, ලෙව්වන්දූව, බ. වැලිපැන්න, නැ. වැලිපැන්න යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුලත් වැලිපැන්න ගම්සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1973 ජූනි 7 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නො ලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාර ගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ඩී. සී. සමරතුංග,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 අප්‍රේල් මස 25 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්වන වැලිපැන්න ගම් සහ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග) පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් බාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කෙළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් ඒ පිළිබද විස්තර :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–147/1—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලය බටහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශයට අයත්වන අධිකාරිපත්තුව ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලය බටහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශයට අයත් රයිගම, පනාපේ, අටළුගම, බමුණුමුල්ල, ගැලනිගම, වැටීට, බණ්ඩාරගම, වීදාගම, රඹුක්කන, ගව්මත්පිල, රේරුකාන, අළුත්ගම සහ කිදෙල්පිටිය යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුලත් අධිකාරිපත්තුව ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1973 ජූනි 7 වෙනි දිනට හෝ ඊට පෙර " දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද, මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ඩී. සී. සමරතුංග,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 අප්‍රේල් මස 24 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලය බටහිර ප්‍රා. ආ. නි. කොට්ඨාශයට අයත්වන අධිකාරිපත්තුව ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග) පැහැදිලි අකුරෙන් :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මඟින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–147/2—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන හොරවල ගම්සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, හොරවල නාවුන්තුඩුව, කිරන්තිඩිය, කොට ගෙදර යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුළත් හොරවල ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1973 ජූනි 7 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට-වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩිවීම.
(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.
(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.
(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය
(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික
(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා හා පළාත් පාලන සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ඞී. සී. සමරතුංග,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 අප්‍රේල් මස 25 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන හොරවල ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග) පැහැදිලි අකුරෙන් :————.

(2) ලිපිනය :————.

(3) ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

(4) (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය හා ස්ථානය :————.

(5) විවාහක අවිවාහක බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් :————.

(7) දැනට කරන රක්ෂාව :————.

(8) මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(9) තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

(10) ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(11) ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මඟින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(12) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–147/3—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**ජාතික පෝෂකම් සංස්ථාව**

ලිපිකරු තනතුරු (විගණක වැඩ සඳහා)

**වයස.**—අවුරුදු 30 කට වැඩි නොවිය යුතුය.

**සුදුසුකම්.**—1. ගණිතය හෝ අංක ගණිතය ඇතුළු විෂයයන් 6 කින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය.

2. ලංකා කාර්මික විද්‍යාලයේ හෝ ජෝන් තබක්නන්ගේ ආයතනයේ හෝ පොත් තැබීම පිළිබඳ මධ්‍ය පරීක්ෂණයෙන් සාමාර්ථය.

**පළපුරුද්ද.**—වෘත්තිය ගණකාධිකාරීන්ගේ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක විගණක කටයුතු පිළිබඳ අඩුම වශයෙන් අවුරුදු 2ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය.**—මසකට සියළු දීමනා සහිතව රු. 265—7×10—රු. 335.

අයදුම්කරුවන් විසින් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහාද, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද, දැනටමත් පනවා ඇති ව්‍යවස්ථා හෝ මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා හෝ පිළිපැදීම අවශ්‍ය වන්නේය.

දැනටමත් රජයේ හෝ සංස්ථා සේවයේ හෝ යෙදී සිටින අයදුම් කරුවන් ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ නම්, වයස, වෘත්තිය සුදුසුකම් හා පාසැලෙන් අස්වූ පසු පළපුරුද්ද (දින සහිතව) පිළිබඳ සම්පූර්ණ විස්තර දක්විය යුතු අතර, ඔවුන්ගේ අයදුම්පත් සමග සහතිකවල සහ චරිත සහතිකවල පිටපතක් ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් 1973 මැයි මස 24 වෙනි දින ප. ව. 4 ට හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ලැබෙන සේ සේවක මණ්ඩල කළමනාකරු, ජාතික පෝෂකර්ම සංස්ථාව, 35/1, හෝර්ටන් පෙදෙස, කොළඹ 7 යනුවෙන් ලිපිනය කොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අයදුම්කරු ඉල්ලුම් කර සිටින තනතුරේ නම, ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ ලොකු අකුරින් පැහැදිලිව ලිවිය යුතුය.

සේවක මණ්ඩල කළමනාකරු.

1973 අප්‍රේල් මස 30 වෙනි දින.

5–166—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

## ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

### ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 45 ට වැඩි නොවිය යුතු අතර, ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයයෙන් ලබා ගතයුතු නියමිත ආකෘති පත් අනුවය.

1. (අ) තනතුර.—ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක. (සංස්ථාවේ විධායක I වන ශ්‍රේණියේ තනතුරකි.)

(ආ) සුදුසුකම්.—

(i) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය සමත්ව අවුරුදු 05 ක පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතු අතර, යටත් පිරිසෙයින් ඉන් අවුරුදු 02 ක් වත් ජ්‍යෙෂ්ඨ විධායක තත්ත්වයේ විය යුතුය. නැතහොත්, මධ්‍ය පරීක්ෂණය සමත් වීමෙන් පසුව අවුරුදු 08 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 02 ක් වත් පශ්චාත් වෘත්තීය පළපුරුද්ද හා ඉන් අවුරුදු 01 කට නොඅඩු කාලයක් ජ්‍යෙෂ්ඨ විධායක තත්ත්වයේ විය යුතුය.

නැතහොත්

(ii) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී තිබිය යුතු අතර, පශ්චාත් වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) වැටුප් පරිමාණය.—(i) රු. 2,200 දක්වා වැඩි වන පෞද්ගලික වැටුප් පරිමාණයක සුදුසු වැටුප් තලයක පිහිටුවා තනතුර ප්‍රදානය කරනු ලැබේ. (මෙය ඉහත "ආ" (i) හි සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට අදාළ වේ.)

(ii) රු. 1,600—50×4—රු. 1,800. (මෙය ඉහත "ආ" (ii) හි සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට අදාළ වේ.)

2. අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද සලකා බැලීමෙන් පසුව අදාල වැටුප් පරිමාණයන්හි සුදුසු වැටුප් තලයක පිහිටුවා පත්වීම ප්‍රදානය කිරීම සලකා බලනු ලැබේ.

3. ඉල්ලුම් පත් සහ වැඩි විස්තර ලිපිනය සහිත මුද්දර ගැසූ ලියුම් කවරයක් මා වෙත එවීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ හෝ ලබා ගත හැකිය.

4. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රාජ්‍ය සංස්ථාවල සේවයෙහි නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම් පත් 1973 මැයි මස 25 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

සේවක මණ්ඩල කළමනාකරු.

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව,
1 වන මහළ,
චාර්ටර්ඩ් බැංකු ගොඩනැගිල්ල,
රැජින වීදිය,
කොළඹ 1.
1973. 05. 02.

5–207—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා බැංකුව

### පරිශ්‍ර අංශයේ කළමනාකරුගේ සහායක තනතුරු

පරිශ්‍ර අංශයේ කළමනාකරුගේ සහායක තනතුරු දෙකක් සඳහා අයදුම් පත් බාරගනු ලැබේ.

කොළඹ 1, යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ මධ්‍යම කාර්යාලයේ මාණ්ඩලික අංශයේ කළමනාකරුගෙන් ලබාගත හැකි පෝර්ම්වල ඉදිරිපත් කළ යුතු අයදුම්පත් 1973 ජූනි 02 දින හෝ ඊට පෙර ඔහුට ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත් පෝර්ම සඳහා ඉල්ලුම් සමග තම ලිපිනය සඳහන් මුද්දර ගැසූ කවරයක් (4"×9" ප්‍රමාණය) බහා එවිය යුතුය.

1. සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම—

(ආ) තමන් ලාංකිකයෙකු බවටත් ;

(ඊ) 1973 ජූනි 02 දිනයට තමන්ගේ වයස අවුරුදු 25 ට නොඅඩු එහෙත් 40 ට නොවැඩි බවටත් ;

(ඌ) මනා චරිතයක් ඇති නීරෝගී කෙනෙකු බවටත් පිළිගත හැකි සාධක ඉදිරිපත් කළ යුතුය.

පරිශ්‍ර අංශයේ කළමනාකරුගේ සහායක තනතුරක් සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුම, අධ්‍යාපන සුදුසුකම් වශයෙන් ;

(1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(2) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ද, අංක ගණිතය හෝ ගණිතය ද ඇතුළුව එකම වරකදී විෂයයන් හයකින් සමත් වී, අ. පො. ස. (සා. පෙ.) සහතිකය ද ;

වෘත්තීය සුදුසුකම් වශයෙන් යටත් පිරිසෙයින් පහත සඳහන් සුදුසුකම් වලින් එකක් පමණක්වත් ලබා සිටිය යුතුය—

(1) Building Technicians Certificate of the City & Guilds of London Institute;

(2) Final Certificate in Bricklaying and Plastering of the City & Guilds of London Institute;

(3) Full Technological Certificate in Building Trades of the City & Guilds of London Institute;

(4) අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනවල, කණිෂ්ඨ කාර්මික නිලධාරි (සිවිල්) සහතිකය හෝ කාර්මික ශිල්පීන්ගේ (සිවිල්) සහතිකය ;

(5) අම්පාරේ, හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ සිවිල් ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ;

(6) අධ්‍යාපන අමාත්‍යාංශයේ, කාර්මික ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ (සන්ධ්‍යා) සහතිකය ;

(7) ඉහත කී සුදුසුකම් වලට සමාන හෝ උසස් සුදුසුකම් ; මීට අතිරේකව, ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම පිළිබඳව ද, විදුලිබල වැඩ පිළිබඳව ද, බැංකුව විසින් ප්‍රමාණවත් යැයි සැලකෙන ප්‍රායෝගික පළපුරුද්දක් ද අයදුම්කරුවන්ට තිබිය යුතුය.

2. වැටුප් හා දීමනා.—පරිවාස කාලය තුළදී මසකට රු. 325 ක මූලික වැටුපක්.

රු. 375.00—රු. 965.00

ස්ථිර කිරීමෙන් පසුව :—————————————
3 × 25 ; 1 × 35 ; 8 × 30 සහ 6 × 40

බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව විශේෂ ජීවනාධාර දීමනාව ද ගෙවනු ලැබේ.

3. සුරැකුම්.—තෝරාගත් අයදුම්කරුවන් ඔවුන්ගේ රාජකාරි කටයුතු නියමිත අන්දමින් හා විශ්වාසවන්ත ලෙස ඉටු කිරීම සඳහා, මුදලින් හෝ ඇප ඔප්පුවක් මගින් හෝ ඒ දෙආකාරයෙන්ම එකතුව හෝ රු. 10,000.00 ක සුරැකුම් ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. සේවා නියමයන් හා කොන්දේසි.—තෝරාගත් අයදුම්කරුවන්—

(ආ) පත්වීම ලැබීමට පෙර, රජයේ රෝහලකදී පවත්වන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය ;

(ඇ) පත්වීම ලැබූ දිනයේ සිට අවුරුදු තුනක පරිවාස කාලයක් සේවය කළ යුතුය ;

(ඊ) 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධානයන්ට මෙන්ම රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාරියෙහිලා දැනට බලපැවැත්වෙන හෝ අනාගතයේදී ඉදිරිපත් කරන්නට ඉඩ ඇති හෝ කිසියම් නීති හෝ ව්‍යවස්ථාවන් අනුගමනය කිරීමේ කොන්දේසියකට ඔවුන් එකඟ විය යුතුය ;

(ඌ) බැංකුවේ අදාළ විශ්‍රාම නඩත්තු ක්‍රමයට ඇතුළත් විය යුතු අතර එම විශ්‍රාම නඩත්තු ක්‍රමයට රජය විසින් ඇති කරනු ලබන වෙනස්කම් වේතොත් ඒවාට යටත් විය යුතුය.

(ඒ) වයස අවුරුදු 55 පිරීමේදී බැංකු සේවයෙන් විශ්‍රාම යා යුතුය.

5. තෝරාගත් අයදුම්කරුවන් රාජ්‍ය භාෂාව පිළිබඳව නියමිත මට්ටමේ ප්‍රවීනත්වයද ලබා සේවය පිළිබඳ සතුටුදායක වාර්තාවක් ද පිහිටවුවහොත්, පත්වීම ලද දිනයේ සිට අවුරුදු තුනක සේවා කාලයක් සම්පූර්ණ වූ පසු ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කරනු ලැබේ.

තවද, තෝරාගත් අයදුම්කරුවන් ඔවුන්ගේ හතරවැනි සේවා අවුරුද්ද අවසානයෙන් පසුව ලැබිය යුතු වැටුප් වැඩිවීම දිගටම ලබන්නට නම් ඔවුන්ගේ පස්වෙනි සේවා අවුරුද්ද අවසන් වන්නට පෙර ලංකා බැංකුව මගින් හෝ ලංකා බැංකුව වෙනුවෙන් හෝ පවත්වනු ලබන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා විභාගයේ IV වෙනි ශ්‍රේණියෙන් සමත්කම් ලබාගත යුතුය.

6 ඉල්ලුම්කරුවන් තම අයදුම්පත් වලට පහත සඳහන් ලේඛන වල පිටපත් ඇමිණිය යුතුය (මුල් ලේඛන නොවේ) :

(1) උප්පැන්න සහතිකය.

(සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි මාලාවේ කාර්යයන් සඳහා නිකුත් කළ උප්පැන්න සහතික බාරගනු නොලැබේ.)

(2) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්.

(3) වෘත්තීය/ශිල්පීය සහතික පත්.

(4) අයදුම්කරුගේ චරිතය හා පත්වීම ලැබීමට යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක්.

7. අයදුම්කරුවන් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට නියමිත වේලාවේදී ඉදිරිපත් විය යුතුය. මේ සම්බන්ධයෙන් ගමන් ගාස්තු හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

8. තම අයදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දැනුම් දීමට හැකි වනු පිණිස තමන්ගේ ලිපිනය සඳහන්කොට මුද්දර ගැසූ ලියුම් කවරයක් අයදුම්පත සමග එවිය යුතුය.

9. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "පරිශ්‍ර අංශයේ කළමනාකරුගේ සහායක තනතුරු සඳහා අයදුම්පත" යනුවෙන් පැහැදිලිව ලකුණු කළ යුතුය.

10. අවශ්‍ය සුදුසුකම් නොමැති අය ඉල්ලුම්පත් එවීමෙන් වැළකී සිටිම මැනවි. මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සියලු ආකාරයෙන්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පතෙහි කිසියම් වැරදි ප්‍රකාශයක් ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර, තෝරා ගැනීමෙන් පසුව එවැනි වරදක් අනාවරණය වුවහොත් ඔහු සේවයෙන් නෙරපා හරිනු ඇත.

12. කිසියම් අයදුම්කරුවෙකු ගැන නිර්දේශ කරන්නට කැමති කෙනෙකු වෙතොත් එසේ කළ යුත්තේ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා පත් කිරීම සම්බන්ධයෙන් මොනම අන්දම කවත් පෙළැඹවීමක් හෝ බලපෑමක් කරන්නට උත්සාහ කළහොත් ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත් වන්නේය.

එස්. වී. වීරසිංහ,
කළමනාකරු/මාණ්ඩලික අංශය.

5–177—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කරගනු ලබන අපේක්ෂකයා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කපිතාන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීමක් පිරිනමනු ලබන අතර, ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට ඇතුළත් කරනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත් කරගනු ලබන ඉල්ලුම්කරුට පහත දක්වා ඇති පරිදි නිලයට අනුකූලව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ :—

කපිතාන් : වාර්ෂික වැටුප—රු. 9,240—8 × 180—රු. 10,680
(මාසික වැටුප—රු. 770—8 × 15—රු. 890)

මේජර් : වාර්ෂික වැටුප—රු. 11,400—8 × 240—රු. 13,320
(මාසික වැටුප—රු. 950—8 × 20—රු. 1,110)

ලුතිනන් කර්නල්—වාර්ෂික වැටුප—රු. 15,000—7×360—රු. 17,520
(මාසික වැටුප—රු. 1,250—7×30—රු. 1,460)

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

**විවාහක නිලධාරීන්ගේ දීමනාව :**

මසකට රු. 750 හා රු. 775 ට අඩු—මසකට රු. 97.50

මසකට රු. 775 හා ඉන් ඉහළ—මසකට රු. 100.00

**වෙනත් දීමනා**

(i) මූලික නිල ඇඳුම් දීමනාව—රු. 1,000.

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව—මසකට රු. 25.00.

(iii) අනුගාමික දීමනාව—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.

(iv) වෙන්ව සිටීමේ දීමනාව—

(i) සාමාන්‍ය රාජකාරි සඳහා තුළ වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුළ වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්

(ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුළ වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුළ වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප් මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බල පවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි/

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අයදුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) **ජාතිය.**—අපේක්ෂකයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) **වයස.**—අපේක්ෂකයන් 1973. 05 .31 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—අපේක්ෂකයින්, නීතිඥ මණ්ඩලයේ සාමාජිකයෙකු සේ කාර්යයෙහි යෙදී පළපුරුද්ද දක් ඇති ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකලාදෝරුවන් විය යුතුයි.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—යුද්ධ හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයක් අපේක්ෂකයන්ට තිබිය යුතුය.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත් අකුරින් විය යුතු අතර, 1973. 05. 31 වැනි දින දවල් 12ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පත් බහාලන කවරයේ "යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. ශ්‍රී ලංකා නාවික හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඇතුළත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත්කරගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත්, රජයේ විශ්‍රාම වැටුප් සිම් සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික,

(ඇ) අඩුගණනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත්, ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

(ඈ) බඳවා ගැනීමේ ලිපිය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුව හොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත්කරගැනීම කරනු ලබන්නේ එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගන්නා ඉල්ලුම්

කරුවනට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර; ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කරගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තෝරා පත්කරගනු ලබන අයදුම්කරු හමුදා පුහුණුවක් ලබා ගැනීමට හා මොනයම් හමුදා ඒකකයක ජීවි සම්බන්ධ කටයුතු කිරීමට බැඳී සිටිය යුතු අතර දිවයිනේ මොනයම් පළාතක වුවත් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

11. තනතුර විශ්‍රාම වැටුප් සහිත නොවේ. අර්ථසාධක අරමුදලක් සඳහා තම දායක මුදල් වශයෙන්, තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක් අඩු කර ගැනීමට තම කැමැත්ත දෙන බවට, තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් ලියවිල්ලකින් ප්‍රකාශ කළයුතු වන්නේ ය. සේවා විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂික දීමනාවක් දීම පිළිබඳව 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයේ ඇති රෙගුලාසි, මෙම තනතුර සඳහා අදාල නොවන්නේ ය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද්ධ හමුදාපති වෙනුවට.

1973 අප්‍රේල් 30 දින.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරී තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ජාතිය (ලාංකිකයෙකු වූයේ පෙළපතින් ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.
3. ලිපිනය—
   - කාර්යාලයේ :————.
   - වාසස්ථානයේ :————.
4. උපන් දිනය :————.
   - 1973.05.31 වැනි දිනට වයස :—
   - අවුරුදු :—, මාස :—, දින :—.
5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :—
   - මවගේ :————.
   - පියාගේ :————.
6. ඔබ විවාහකද? අවිවාහකද? :————.
7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.
8. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.
9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද? :————.
10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද? :————.
11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කළෙහිද? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද? :—.
12. ඔබගේ පාසැල් සමය, විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
    - පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
    - ඇතුළත්වූ දිනය :————.
    - අස්වූ දිනය :————.
    - සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.
13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
    - ස්වාමි පක්ෂය :————.
    - රැකියාවේ ස්වභාවය :————.
    - සේවය කළ කාලය :—— දින සිට —— දින දක්වා
14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :——.
    - ————.
    - ————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

5–188—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

සිංහල යතුරු ලේඛනය පුහුණු කිරීමේ පන්ති

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන්ට යන සිංහල යතුරු ලේඛනය පුහුණු කිරීමේ පන්තිවලට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයටම ඒ සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මේ පන්ති අවුරුද්දක් පමණ කාලයක් කාර්යාල වේලාවන් තුළ කොළඹ දී පවත්වනු ලැබේ. පුහුණුවන්නන් 40 දෙනෙකුට පමණ ඉඩ ඇත.

2. අවශ්‍ය සුදුසුකම් :—සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියකම—

(අ) ලාංකික විය යුතුය. ("ලාංකික" යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් හෝ ලංකාවේ පුරවැසියකු වන කෙනෙකි).

(ආ) (i) සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් සම්මාන සාමාර්ථය සහිතව ලංකා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ii) එකම වාරයක දී අඩු ගණනේ විෂයයන් 5 කින් වත් සමර්ථ වෙමින් විෂයයන් 6 කින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රය ලබා තිබිය යුතුය. මෙකී විෂයයන් 6 අතුරෙන් සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ ගණිතය ඇතුළුව විෂයයන් 4 කින් සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය.

(ඇ) 1973.06.11 වැනි දිනට වයස 17 ට අඩු හෝ 22 ට වැඩි නො-වූ කාමිය යුතුය.

(ඉ) ඉතා හොඳ චරිතයෙන් හා ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

3. කොළඹ දී පවත්වන සම්මුඛ පරීක්ෂණයකට හෝ විභාගයකට අයදුම්කරුවන්/අයදුම්කාරියන් පෙනී සිටිය යුතුය. ඒවා පවත්වන වේලාව හා ස්ථානය පසුව දන්වනු ලැබේ. ඒ සඳහා ගමන් ගාස්තු හෝ අනෙකුත් වියදම් ගෙවනු නොලැබේ. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අයදුම් පතෙහි යම් අසත්‍ය සටහනක් තිබී, තෝරා ගනු ලැබීමට පෙර, ඒ බව දැනගතහොත් එයින්ම ඔහු/ඇ නුසුදුසු වීමටද තෝරා ගනු ලැබීමෙන් පසුව දැනගතහොත් ඔහු/ඇ අස් කර දමනු ලැබීමට ද සිදුවිය හැකිය.

4. පුහුණු වන කාලය තුළ දී කිසිම ගෙවීමක් කරනු නොලැබේ. පුහුණුව අවසානයේ දී අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සේවයෙහි හෝ තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ රැකීරක්ෂා දීම ගැන කිසිසේත් ඇප වන්නේ නැත.

5. පුහුණුවීමේ කාලයේ දී වරින් වර පරීක්ෂණයක් පවත්වා ඒවායේ ප්‍රතිඵල අනුව ආධුනිකයන්ට තවදුරටත් පුහුණු වීමට ඉඩ දෙනු ලැබේ. යම් ආධුනිකයෙකුගේ/ආධුනිකාවකගේ පැමිණීම හෝ ඉගෙනීම හෝ සාමාන්‍ය යෝග්‍යතාව හෝ හැසිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව තෘප්තියට පත් නොවේ නම්, පුහුණුවීමේ කාලය අතර තුර කවර අවස්ථාවක දී වුවත් ඔහු/ඇ පන්තියෙන් වහාම අස් කර දමනු ලබන්නට පුළුවන. එසේ අස් කර දමනු ලැබුවහොත් පසුව පවත්වන පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීමට නුසුදුසු වන්නේ ය. කලින් කල නිකුත් කරන ව්‍යවස්ථාවන් හා නියමයන් අනුව කටයුතු කරන බවට ආධුනිකයා/ආධුනිකාව විසින් ඉ නියමිත පොරොන්දු පත්‍රයක් අත්සන් කළ යුතුය.

6. පුහුණුව අවසානයේදී යෝග්‍යතාව තීරණය කරන පරීක්ෂණයක්ද, අවසාන විභාගය ඉන් අනතුරුවද පවත්වනු ලැබේ. යතුරු ලේඛනය සහ සිංහල භාෂාව යන විෂයයන්ගෙන් යුත් මෙම විභාගයෙන් සමත් වන්නන්ට සහතික පත් නිකුත් කරනු ලැබේ.

7. දැන දැනම වූ නොසැලකිල්ලක් හෝ තදබල අප්‍රවේසම් කමක් නිසා බඩු නැතිවීමක් හෝ උපකරණ ආදියට හානියක් හෝ වුවහොත් අලාභය ගෙවන බවට ඇප කාරයන් දෙදෙනෙකු ඇපයට තබා රුපියල් 100 ක ඇප පත්‍රයකට අයදුම්කරුවන් පන්තියට ඇතුළත් කරගනු ලැබූ විට අත්සන් කළ යුතුය.

8. අයදුම්පත් එවිය යුත්තේ පහත අත්සන් කරන නිලධාරි තැනගේ පුද්ගලික නාමයට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 598, කොළඹ 7" යන ලිපිනයටය. අයදුම්පත්, මෙහි පහත පළවන ආදර්ශ පිටපත අනුව තමාගේ අත් අකුරෙන් ම ලියා 1973.06.11 වැනි දිනට හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1973 අප්‍රේල් මස 27 දින,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත, කොළඹ 7.

**සිංහල යතුරු ලේඛනය පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් වීම සඳහා අයදුම්පත**

(1) සම්පූර්ණ නම (පැහැදිලිව ලියන්න) :————.

(2) සම්පූර්ණ ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයකු වූයේ පෙලපතින් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන බව සඳහන් කරන්න) :————.

(4) 1973.06.11 වන දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය. මුල් සහතික පත් නොවේ) :————.

(5) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(6) විවාහකද ? අවිවාහකද :————.

(7) සමර්ථ වූ උසස්ම විභාගය (විෂයයන් හා දිනය සමග : ————.

(8) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ අ. පො. ස. ප. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය සහ සම්මාන ලැබූ විෂයයන් (සහතික පිටපත් අමුණන්න. මුල් සහතික නොවේ. සහතික පත් ලැබී නැත්නම් ප්‍රධානාචාර්යවරයාගේ සහතිකයක් හෝ වෙනත් පිළිගත හැකි සහතිකයක් භාරගනු ලැබේ) :————.

(9) ඉගෙනීම ලැබූ පාඨශාලා (දිනයන් සමග) :————.

(10) සිංහල දැනුම් පිළිබඳ විශෙෂ සුදුසුකම් ඇතොත් ඒ බව : ————.

(11) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යතුරු ලියනය පිළිබඳ දැනුමක් තිබේද ? :————.

(12) දන් රක්ෂාවක යෙදී සිටි නම් ඒ බව :————.

(13) පියාගේ හෝ භාරකාරයාගේ නම හා ඔහුට/ඇයට ලියුම් ලැබෙන පිළිවෙළ :————.

(14) තමා ගැන තොරතුරු විමසිය යුත්තන් දෙදෙනෙකුගේ නම් හා ලියුම් ලැබෙන පිළිවෙල :————.

(15) අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සුදුසුකම් හා චරිතය පිළිබඳ සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන්, මේ සහතික පත්වල පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි. එක් සහතිකයක් තමා අන්තිමට ඉගෙන ගත් පාසලේ මුල් ගුරුතුමාගෙන් විය යුතුයි. (අවශ්‍ය මුළු සහතික පිටපත් ගණන 3 කි) :————.

(16) වෙනත් සුදුසුකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

5–204—73.05.11 දින අංක 59 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.28 බදාදා | දවල් 12.00 |
| | 73.04.11 බදාදා ... | 73.04.04 බදාදා | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.18 බදාදා | දවල් 12.00 |
| මැයි ... | 73.05.04 සිකුරාද ... | 73.04.25 බදාදා | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද ... | 73.05.02 බදාදා | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද ... | 73.05.09 බදාදා | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද ... | 73.05.15 අඟහරුවාදා | දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද ... | 73.05.23 බදාදා | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද ... | 73.05.30 බදාදා | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද ... | 73.06.06 බදාදා | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද ... | 73.06.13 බදාදා | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද ... | 73.06.20 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. සී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.